

# ආ මග

ශශිකලා සේනාධීර

# ආ මග

ශශිකලා සේනාධීර

# ආ මග

ශශිකලා සේනාධීර

ප්‍රථම එළිදැක්ම : 2023 දෙසැම්බර් 24

කර්තෘ ප්‍රකාශනයකි

ISBN 978-624-208-152-6

# පිදුම

මා අනෙකෙකු නොව
මම ''මා'' බවට පත්කළ
මට මා මුණගස්වපු
මට මාව සොයා දුන්
උපතින් ගෙන ආ
සහජ කුසලතා තිබුණද
එය හඳුනාගත්
එය ඔප්නංවපු
මා බබළවපු
ජයග්‍රහණයේදී මා සමග සතුටු වූ
පරාජයේදී මා හඬනා විට
දරාගැනීමට උගන්වපු
ජීවිතය මෙසේ යයි
අර්ථ විවරණය කළ ....
දිනෙක මා ජයගන්නා බව
මසිතට
ඒත්තු ගැන්වූ
මා විජයග්‍රහණයට ගෙන ගිය
ඔබටයි මේ
ආදරණීය උපහාරය
මාගේ විදුහල් මෑණියනි.

# පෙරවදන.

## ආ මග

විශ්වය ආරම්භයේ සිට වාර්තමානය දක්වා වු වෙනස්කම් විශ්ලේෂණය කිරීමෙන්, විශ්වය ගැන මෙන් ම මිනිසා ගැනද ගැඹුරු අවාබෝධයක් ලබා ගත හැකිය ඒ සඳහා වත්මනෙහි පවතින මඟක් වන්නේ එදිනෙදා ලබන අත්දැකීම් ලේඛනගත කිරීම ය.  පුද්ගලයකු එසේ ස්වකීය අත්දැකීම් ලේඛනගත කිරීමෙන් ජීවිත ඉතිහාසය පර්යේෂණයක් (Life history research)  සඳහා පදනමක් ද ලබා දිය හැකි ය. මේ පදනම අනුව මහාමායා විදුහල්පතිනි ශශිකලා සේනාධීර මහත්මිය ලියා ඇති 'ආ මඟ' නම් ලේඛනයට පර්යේෂණාත්මක වටිනාකමක් හිමි ව ඇත්තේ ය.

ලේඛන ශෛලිය අනුව 'ආ මඟ' ලේඛනයේ අවධානය ලැබිය යුතු පාර්ශ්ව දෙකක් ඇත්තේ ය. එයින් පළමු වන පාර්ශවය නම් ප්‍රත්‍යවේක්ෂණය (Reflection)   මුසු ලේඛන ශෛලීයයි. දෙවැන්න නම් මතක සටහන් ලියවිලි (Memo writing) රටාවයි. ස්වකීය අත්දැකීම් පිළිබඳ ව ලිවීමේ ලා පවතින විවිධ ක්‍රම අතරින් එකක් වන්නේ අත්දැකීම් පිළිබඳ ව ස්වකීය ප්‍රත්‍යාවික්ෂණ ද සමාජයේ අන් සාමාජිකයන්ගේ ප්‍රත්‍යාවික්ෂණ ද සහිත ව ලිවීමයි. ඒත් අතර ම තම අත්දැකීම් පිළිබඳ ස්වකීය හැඟීම් ද ආකල්ප ද මුසු ව ලේඛන ගත කළ විට මෙමෝ සටහන් ජනිත වන්නේ ය මේ ලක්ෂණ ද්වය ද ' ආ මග ' ලේඛනයේ දක්නට ලැබෙන්නේ ය. ක්‍රියා මුලික පර්යේෂණ (Action research) කරන විට මේ ලක්ෂණ ද අවධාරණය වන නිසා, ක්‍රියාමුලික පර්යේෂණ වල නියැළෙන ගුරුවරුනට, 'ආ මග' ලේඛනයෙන් ධනාත්මක ආදර්ශ ලබා ගත හැකි ය.

ආචාර්ය ගොඩ්වින් කොඩිතුවක්කු,

2023.12.22

අද තවත් එක් රාජකාරී බහුල දිනයකි. උදෑසන සිට පාසලේ ගත කළ වෙහෙසකාරී බව නිවසට පැමිණි පසු තදින්ම දැනෙන්නට විය. මනසට විවේකයක අවශ්‍යතාව දැඩිව දැනුණු නිසා මූණ කට සෝදා සැහැල්ලු ඇඳුමකට මාරු වූ මා, කෙමෙන් අඳුර ගලා එමින් පැවතියත් කෙටි නින්දක දැඩි අවශ්‍යතාවය මට තදින් ම දැනිණ. නමුත් මා නොදැනුවත්වම වාගේ මාගේ සමීපතම යහළුවා වන ජංගම දුරකතනය අතට ගත්තෙමි. එහි තිබුණු මාගේ කුඩා කළ ඡායාරූප කිහිපයක් වෙත මාගේ නෙත් යොමු විණි. ජංගම දුරකතන තිරය මත ඉහළ පහළ නෙත් යැව්වෙමි.

මට අවුරුදු 5 ක අවධිය මට තරමක් මතක ය. මාගේ මාමා බලන්නට කෝච්චියෙන් කොළඹ ගියේ අම්මා, තාත්තා, අක්කා හා අයියලා දෙන්නාත් සමඟ යි. එහි දී මම අළුත් යෙහෙළියන් දෙදෙනෙකු සමඟ බෝනික්කන් නැලෙව්වෙමි. සෙල්ලම් ගෙදර අම්මා වුණ සැටි මගේ මතකයේ අදටත් හොඳින් ම ඇඳී තියෙන්නේ ඒ මාගේ පළමු දුම්රිය චාරිකාවත් සමඟ හිතේ ඇඳුණු සේයාවර නිසාදෝයි මට හැඟේ.

පසුදින ආපසු කෝච්චියේම ගෙදර ආ හැටිත් , ඊටත් පසු දින තාත්තා ඩිස්පැන්සෙරියේ වැඩ කරමින් සිට නිවසට පැමිණ පපුවේ අමාරුවක් යැයි පවසා, නිවසේ පුටුවේ අමාරුවෙන් වාඩි වී සිටි හැටිත්, තාත්තාගේ යාලුවෙක් හා අම්මා තාත්තාව රෝහලට ගෙන ගිය හැටිත් ඊට පැය කිහිපයකට පසු තාත්තා පෙට්ටියකින් නිවසට ආ හැටිත්, අනිත් අය අඬනා නිසා මමත් ඇඬූ සැටිත්, ඡායාමාත්‍රයක මතකයක් මා සතුව ඇත.

තාත්තා අපව හැර යෑම මට දැඩිව නොදැනුණේ මට එය එතරම් තේරුම් ගැනීමට තරම් මගේ මනස මුහුකුරා ගොස් නොතිබුණු නිසා වෙන්නට ඇත. තාත්තාගේ වියෝව නිසා අපව රැක බලා ගැනීමට

ව්‍යාපාරකයෙකු වන තාත්තාගේ මල්ලී, බාප්පා අපව බලා ගැනීමට පසුව ඉදිරිපත් විය.

මගේ නිවස නගර මධ්‍යයේ පිහිටා තිබුණු නිසාත් ඒ ආසන්නව තිබුණු පෙර පාසලකට අම්මා මාව ඇරලුව සැටිත්, එදා මා හරි සතුටින් යාළුවන් සමඟ එකතු වී සෙල්ලම් කළ සැටිත්, නොමැකෙන මතකයකි. පෙර පාසලේ දී මට එකේ සිට ගණන් කරන්නට කියූ අවස්ථාවක මම එකේ සිට සියය දක්වා කට පාඩමින් ගණන් කළෙමි. ඒ මාගේ සහෝදර සහෝදරියන් ගණන් කරන හැටි උනන්දුවෙන් මා අසා ගත් නිසාවෙනි. එදා එම ගුරුතුමිය මාව ලොකු ඇගයීමකට ලක් කළා ය. ඒ වෙලාවේ මට ලොකු ආඩම්බරයක්, සතුටක් දැනුණි.

පෙර පාසලෙන් පසුව මම නිවස ආසන්නයේ තිබුණු පාසලක බාලාංශ පන්තියට ඇතුළත් වීමි. මම සති දෙකක පමණ කාලයක් එම පන්තියේ සිටියෙමි. ගුරුතුමිය මට කීවා "පුතේ, ඔයා ඉගෙන ගන්න දක්ෂයි. අද ඉඳලා ඔයාව දෙකේ පන්තියට දානවා. අපි ඒ පන්තියට යමු " කියලා. 5 පන්තියට එන තුරු පන්තියේ පළවෙනියා වෙන්න මට හැකි වුණි. පාසල් ක්‍රීඩා උත්සවයේ වයස අවුරුදු 11 න් පහළ ක්‍රීඩා ඉසව් තුනකට ප්‍රථම ස්ථානය දිනා ගත් බව මට මතකයේ තැතත් මා ළඟ තිබෙනා සහතික වලින් එය තහවුරු වෙනවා. 5 ශිෂ්‍යත්ව විභාගය පැවැත් වුණේ මගේ පාසලට ආසන්නව තිබූ වෙනත් පාසලක විය. එදා රචනාවට මම ලිව්වේ මගේ ගෙවත්ත ගැන යි. එය ඉතා ලස්සනට ලියූ බව මට හොඳටම මතක ය. විභාගය ලේසි බවත් මට දැනුණි.

ශිෂ්‍යත්ව ප්‍රතිඵල ඒමට පෙර උසස් බාලිකා විද්‍යාලයටත්, මහාමායා බාලිකා විද්‍යාලයටත් ඇතුළත් වීමේ විභාගයන්ට මුහුණදීමට මා යෙහෙළියනුත් සමඟ ආ හැටිත්, මහාමායාවේ ටෙරසස් වලට වෙලා ඉඳගෙන සිටි සැටිත් මට අද වාගේ මතක ය. එදා මගේ හිසේ මලක් පිපුණා මෙන් විය. මහමායාවේ ඉගෙන ගැනීමේ ලොකු හීනයක් හිතේ ඇඳුනි.

හැමදාම මිදුලෙහි අෑත බලා සිටින්නේ නුවර පාසලකින් මා හට ලියුමක් ඒ වීදෝ යැයි සුන්දර බලාපොරොත්තුවකිනි. ඒ දිනය පැමිණියේය. මා මහාමායා බාලිකා විද්‍යාලයේ ඇතුළත් වීමේ විභාගයෙන් සමත් වී ඇති බවත් පාසලට ඇතුළත් කිරීම සඳහා පැමිණෙන ලෙසත් එම ලිපියේ සඳහන් විය. මහාමායාවේ දැනට ශ්‍රවණාගාර ගොඩනැගිල්ල පිහිටි ස්ථානයේ තිබුණු පැරණි නිවසක් වැනි ගොඩනැගිල්ලක තිබුණු 6-ක පන්තියට මම ඇතුළත් වීමි. පන්තියේ සිටි සියලුම දෙනා ඇතුළත් වීමේ විභාගයෙන් සමත් වී පැමිණියවුන් විය. උද්යෝගයකින් ආශාවකින් පාසලට පැමිණියේ හිතේ තරමක ආඩම්බරයකිනි. ඊට ටික දිනකට පසු පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් ද මා සමත් වී ඇති බවත්, මහමායා බාලිකා විද්‍යාලයට මා තේරී පත්වී ඇති බවත් දන්වා එවා තිබුණි. මට හිමි පාසල පළමුවත් දෙවනුවත් මහාමායාවම වීම පිළිබඳ අදටත් මා තුළ සියුම් ආඩම්බරයක් ඇති කරවයි. පාසල් නිවාසාන්තර ක්‍රීඩා උත්සවයට මම ඉතා ආශාවෙන් යෙහෙළියන් සමඟ විවිධ ක්‍රීඩා ඉසව් සඳහා පුහුණු වීමි. නමුත් තරග සඳහා ඉදිරිපත් වීමට මට තේරුමක් නොමැති විය. හත ශ්‍රේණියේ අක්කලා ඒ සඳහා තේරී පත්විය. ඊළඟ අවුරුද්දේ තනි තරග ඉසව් තුනකටම මාව තෝරාගැනිණි. සහාය දිවීමටත් මාව තෝරා ගැනිණි. ක්‍රීඩා උත්සවයේ තරග ඉසව් තුනකින්ම ප්‍රථම හා දෙවන ස්ථාන ලබා ගැනීමට මට හැකි විය. එම වසරේ නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවයේ 13 න් පහළ අනුශූරතාව මට හිමි විය. එදා මට මා ගැන ලොකු ආඩම්බරයක් දැනුණි. ඉන්පසු පාසලේ මලල ක්‍රීඩා කණ්ඩායමේ සාමාජිකාවක් බවට නිතැතින්ම පත්විය. විවිධ අවස්ථාවල පාසලට ජයග්‍රහණ ලබාදෙන්නට මට හැකිවීම නිසා මම නිහතමානීව ආඩම්බර වීමි. ක්‍රීඩාව මගේ ජීවිතය තවත් අංගයක් වුණා. මම ක්‍රීඩාවට ආදරය කරන්නට පටන් ගත්තෙමි. ක්‍රීඩාව මගේ ජීවිතය විය. මට හැඟෙන්නේ ඒ තුළින් මට අපේ අක්කලා නංගිලා සමග සමීප මිතුදමක් පවත්වාගෙන යන්නට මට හැකියාව ලැබුණා කියා යි. මම හතේ පන්තිය ඉගෙනගන්න කාලේ ජයවර්ධන ජනාධිපතිතුමා පිළිගන්න පාසලෙන් නැටුමක් සකස් කළා. හයේ සිට දොළහ පන්ති දක්වා

නැටුම් ඉගෙන ගන්නා සියලුම ශිෂ්‍යාවන් විශාල සංඛ්‍යාවක් මේ සඳහා තෝරා ගත්තා.නැටුම් පුහුණු කළේ පාරම්පරික ගුරුන්නාන්සේ කෙනෙක්. මම නටනවා බලන් ඉඳලා  ඔහු මාව ඉහලින්ම අගය කළා. "මුලු කණ්ඩායමෙන්ම හොඳම නැට්ටුවා තෝරනවා. තෑග්ගකුත් දෙනවා" කියලා නිවේදනය කළා. පසු දිනෙක හොඳම නැට්ටුවා මම බවත් ඉදිරි දිනයක තෑග්ග ලබාදෙන බවත් ගුරුන්නාන්සේ කිව්වා. තෑග්ගක් නම් ලැබුණේ නැහැ, නමුත් එදායින් පසු නැටුම් කාලච්ඡේදයේදී හැමදාම ඉදිරියෙන් නටපු මට, "ශෂිකලා මොකක්ද ඔය නටන විදිය.. යන්න  පේළියේ පස්සට" කියලා ගුරුතුමිය පැවසුවා. හොඳම නැට්ටුවා වූ මම  එදා සිට පේළියේ අන්තිමයට සිට නටන්න වුණා. ඒ වගේ ගුරුවරු දැනුත් ඉන්නවා ඇතැයි මා සිතමි. මා හට නැටුම් විෂය එපා විය. නමුත් මා සංගීතයට, චිත්‍රවලට දක්ෂ නැති නිසා සා.පෙළ දක්වාම නැටුම් ඉගෙන ගන්නට සිද්ධ විය.

7-ඩ පන්තියේ ඉගෙන ගන්න කාලේ මම හිටියේ "ඒටෑ" එක ළඟ පන්තියේ. හැමදාම වාගේ 7-ඔ පන්තිය තිබුනේ "ඒටෑ" එකේ. ගුරුතුමියන්ලාගෙන් නිතරම බැනුම් අහන්නේ කරන දඟ වැඩ වලට සීමාවක් නැති නිසා. මගේ පන්තියට ගුරුතුමියක් එනතුරු මම දින කීයක් 7-ඔ පන්තියේ ඉස්සරහට අරගෙන හිටගස්සවලා තියෙනවද? අතීතයේ සොඳුරුම මතකයන් හා සිදුවීම් ස්පර්ශ කළ හැකි වන්නේ ඒ සිදුකළ දඟකාරකම් එක්කමයි කියල හිතෙන්නේ.

මට මතක හැටියට මට පන්තියේ 7-15 අතර ස්ථාන තමයි වාර පරීක්ෂණ අවසානයේ හිමිවුණේ. ඒ කාලේ මම පාඩම් වැඩ කළ හැටි එතරම් මතකයක් නැහැ. සමහර ගුරුතුමියන් ගැන මතක් වෙනකොට අපේ ජීවිතවලට මොනතරම් බලපෑමක් ඔවුන්  කරල තියෙනවද? ඔවුන් අපේ දක්ෂතාවන් හැකියාවන් ඉහල නංවන්නට මොනතරම් දායකත්වයක් ලබා දී තියෙනවාද කියලා ආපසු හැරිලා ජීවිතය දිහා බලන විට මට පෙනෙනවා. මම බාලදක්ෂිකාවක් ලෙස බැඳුනේද හතේ පන්තියේදී.

8-ක පන්තියත්ව දාගම සහ අකීකරුම පංතිය ලෙස ඒ කාලේ හංවඩු ගැහිලයි තිබුණේ. මමත් ඒ පන්තියේ.. :හැරිලා බැලුවම 8-ක පන්තියේ වැඩි හරියක් දැන් ආයතනවල ඉහළම තනතුරු හොබවනවා* දවසක් මගේ විද්‍යාව ගුරුතුමී මට බැන්න හැටි මට තාම මැව්ලා පෙනෙනවා. "මේ ළමයා නේද.. මේ ළමයානේද.. ශෂිකලා... මේ ළමයාට මේ බිල්ඩින් එකේ වහලේ ඉඳලා අර බිල්ඩින් එකේ වහලෙට පනින්න බැරි එක විතරයි තාම. තව ටික දවසකින් ඒකත් කරයි. හදන්න බෑ මේ ළමයා නම්□. ඇත්තටම හරිම සුන්දර අතීත මතක. මෑතකදී ඒ ගුරුතුමිය හමුවුණා මට. ඇය බැන්න හැටි මතක් කරමින් ඇය සමග සුන්දර අතීතයට එදා ගියේ ඇයගේත් මගේත් නෙතඟට කඳුලක් එක් කරමිනි. එය අතීතය සතුටින් සිහිවන සතුටු කඳුලක් හා ඇයව දකින විට ගුරුගෝල සම්බන්ධතාවක් සමග ඇතිවන හෘදයාංගම බැඳීමකි.

9 පන්තියේදී මම මළල ක්‍රීඩාවෙන් තරමක් ඈත් වුණා. ක්‍රීඩා පුහුණුවට විධිමත්ව සහභාගි නොවීම නිසා ඇති වූ ශරීරයේ තරබාරුකම නිසාවෙන් මම දිවීම්, පැනීම් වලින් ඈත් වී විසිකිරීම් ඉසව් සඳහා පමණක් යොමු වුණා. ඒත් සමගම හොකී ක්‍රීඩාවට සම්බන්ධ වුණා. ඉතා ආශාවෙන් පුහුණුවීම් වල යෙදුනා. අව්ව, වැස්ස මා හට දැනුනේ නැහැ. හොකී පුහුණුකරු තාමත් හිතේ ඇඳුණු ආදරණීය පුද්ගලයෙක්. ඔහු මට ජීවිතය ඉගැන්වුවා. (හොකී ක්‍රීඩාවේ හිනි පෙත්තටම යන්නට මට හැකිවුණා. පාසල් හොකී ක්‍රීඩා කණ්ඩායමේ උපනායකත්වය, නායකත්වය දරන්නට, එයින් පාසලට කීර්තියක් ලබාදෙන්නට මට හැකි වීම පිළිබඳව දැනෙන්නේ හරිම සතුටක්) මගේ මතකයේ ස්වර්ණමය මතකය වන 1988 වර්ෂයේ පාසලේ හොකී වර්ණ ලාභිනිය වෙමින් මම එහි උපරිමය කළා. කෙමෙන් අ.පො.ස සා.පෙළ විභාගයට මුහුණ දෙන කාලය එළැඹුණා. ක්‍රීඩාවන් දෙකක් හා අධ්‍යාපනය සමබරව ගෙන යන්නට හැකි උපරිමයෙන් කටයුතු කළා.

මේ කාලයේ දී අභියෝග රාශියකට මුහුණ දෙන්නට සිදුවුණා. පියා සිටි කල ඉතා සුඛෝපභෝගී ජීවිතයක් ගත කළ අප පවුලට විවිධ ආර්ථික අපහසුකම් දැනෙන්නට වුණා. සමහර දින ගෙවුනේ ඉතාමත් දුක්බර විදියට. නිවසේ පාඩම් කරන මානසික මට්ටමක් නැතිවුණු අවස්ථා අනන්තයි. බාප්පා මත් වතුරට ඇබ්බැහි වීම නිසාත්, අධ්‍යාපන කටයුතු සිදුකිරීමට ඉතා අපහසුතත්වයක් ඇතිවුණා. ඒ බාධක හමුවේ නිවසේදී පාඩම් වැඩ කිරීමට නොහැකිව දින ගණන් පාඩම් වැඩ අතපසු වුණා. ක්‍රීඩා පුහුණුවීම නිමකර නිවසට යන්නේ හවස හයට පමණ. එහිදී ඉගෙන ගන්නට තරම් සුදුසු පරිසරයක් නිවසේ තිබුණේම නැති තරම්. බොහෝ දිනවල රෑට බාප්පාට බයේ නිවසේ පිලට වෙලා ඉන්න සිද්ධ වුණා. බොහෝ රාත්‍රියන් හි මා අහසත් සමග කතා කලා. "තාත්තා හිටියනම්... හිතෙන වාර අනන්ත ය. එතකොට හිතුනේ ජීවිතයකට ඇයි මේ තරම් කරදර බාධක කියලා. කීයට හරි බාප්පා නිදාගත්තට පස්සේ තමයි පාඩම් වැඩ කරන්න පුළුවන් වුනේ. ඒ හැම ජීවිත අත්දැකීමක්ම මාව ශක්තිමත් කළා. ජීවිතය දරා ගන්නට, විවිධ අප්‍රසන්න අභියෝග වලට මුහුණ දෙන්න, කුඩා කල සිටම සිදුවුණා. හැරිලා බලනකොට මම පන්තියේ දඩබ්බර චරිතයක් වෙන්නට ඇත්තේ ඒ නිසාද?

පන්තියේ වැඩිපුරම කොක්කඩලා සිනාසෙන චරිතයක් වුනේ නිවසේදී ඒ අවස්ථාවන් නැති වුන නිසාද? මට මතකයි විජේකෝන් ටීචර් කියනවා " අනේ ශෂිකලා හිනාවෙලා පෙන්නන්නකෝ" කියලා. ඒ තරමටම මගේ හිනාව ප්‍රසිද්ධ වුණා.

මට තාමත් මැවිලා පේනවා ගුරුතුමියන් තුන්දෙනෙක් බුදුමැදුර ළඟදි මට බැන්න හැටි. "අපිට හිතාගන්න පුළුවන් මේ ළමයා ලොකු වෙලා මොනව කරයිද කියලා. කිසි කමකට නැහැ. ඇත්තටම ඒ කාලෙ මගේ පවුලේ ඒ තිබුණු ප්‍රශ්න යාළුවෙක්ටවත් කියන්න මම මැලි වුණා. ආර්ථික අපහසුකම් නොතිබුණාම නොවේ. නමුත් පවුලේ නෑදෑයින් අපට බොහෝ උදව්

උපකාර කළා. දරුවන් හතර දෙනෙකුගෙන් යුත් පවුලේ වියදම් සඳහා ලැබෙන මුදල් මනාව කළමනාකරණය කරගන්න සිද්ධ වුණා. අපගේ ව්‍යාපාර කටයුතු සඳහා මටද විශාල කාර්යභාරයක් ඉටු කළ යුතුව තිබුණා. බොහෝ දිනවල අක්කයි මමයි උදෑසන කෑම උයලා තමයි පාසලට එන්නේ. ඒ වගේම තමයි මම හාල් කිලෝ දහයක පිටි කොටනවා පාසල් ඒමට පෙර. හැබැයි මම මේ හැම දෙයක්ම කලේ ඉතාමත් කැමැත්තෙන්. එවැනි කාර්යයන් තුළින් මගේ බාහු ශක්තිමත් වීම මට ක්‍රීඩාවේදී ඉතාමත් වැදගත් වෙනවා. ක්‍රීඩාවේ ඉහළ ජයග්‍රහණ කරා යාමට එය මට පිටිවහලක් වුණා. ජීවිතයේ දුක, සතුටක් ආශිර්වාදයක් කරගන්න මම පුරුදු පුහුණු වුණා.

මේ සියලු බාධක අභියෝග මැද ක්‍රීඩාව අධ්‍යාපනය සමබරව ගෙනයමින් කටයුතු කිරීමට මට හැකියාව ලැබුණා. මම අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දෙනවා. මට මතකයි විභාගයට ගණිත විෂය තිබුණු දවසේ මම පාසලට ආවහම ක්ලාන්ත වුණා. එදා උදෙන්ම අම්මට ව්‍යාපාර කටයුතු සඳහා යන්නට වුණා. නිවසේ සිටි නැන්දාට අපට කන්න කෑම උයන්න කියලා පවරලා ගියත් ඇයටත් නින්ද ගොස් තිබුණා. මම කිරි තේ එකක් හදාගෙන බීවා. අපට තිබුණා හෝටලයක්. හෝටලයට ගියේ මොනවා හරි කන්න කියලා. ඒත් කිරිතේ බීම නිසා කෑමට පිරියක් නැහැ කඩෙන් මොනවා හෝ කන්නවත්. මම විභාගයට ආවා. ක්ලාන්ත වුණා. මා ක්ලාන්ත වූ බව අම්මාට කවුරු හෝ දන්වා තිබුණා. මම හිතට ශක්තිය ගෙන විභාග ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිව්වා. මාව එක්කන් යන්න එදා අම්මා ඉස්කෝලෙට ආවා.

මාස කිහිපයකින් විභාග ප්‍රතිඵල පාසලේ දැන්වීම් පුවරුවේ දැම්මා. චකිතයකින් යුතුව ප්‍රතිඵල ලේඛනයේ මාගේ නම හා ප්‍රතිඵල සොයමින් දෑස් දිව්වා. මගේ නම ඉදිරියෙන් විෂයයන් අටෙන් විෂයයන් හතකටම විශිෂ්ට සම්මානත්, එක් විෂයක් සඳහා සම්මාන එකකුත් ලෙස ඉහළ

ප්‍රතිඵලයක් සටහන්ව තිබුණා. ප්‍රතිඵල වලින් පාසලේ මුල් 11 දෙනා අතර මා සිටියා.

ප්‍රතිඵල නිකුත් වී ටික දිනකින් ඉංග්‍රීසි ගුරු විභාගයක් සඳහා යෙහෙළියන් ඉල්ලුම් පත්‍ර දැමුවා. මමත් ඒ සඳහා ඉල්ලුම් කළා.ඒ අතර මම උසස් පෙළ සඳහා විද්‍යා විෂය ධාරාවෙන් ඉගෙන ගන්න තීරණය කළා. මගේ තාර්කික චින්තනය තරමක් හොඳයි. විෂයටත් ආසයි. නමුත් හොකී ක්‍රීඩාවත් සමඟ උසස් පෙළ විද්‍යා විෂයන් හැදෑරීම සම්බන්ධයෙන් මවගේ දැඩි විරෝධයක් ඇති වුණා. නිවසේ ඉගෙනුම් පරිසරයක් ද නොතිබුණු නිසා මම නේවාසිකාගාරයට යෑමට තීරණය කළා. නේවාසිකාගාරයට පැමිණීමත් සමඟ හොකී ක්‍රීඩාවේ නිරත වීමට මා හට ලොකු අවකාශයක් හිමි වුණා. එහිදී අධ්‍යාපනයට තැබූ බර ප්‍රමාණවත් නොවුණාද? මාගේ හැකියා මට්ටම තිබුණු උපරිමයෙන් මා විභාගයට සූදානම් වුණා.

මේ කාලයේ පාසල් හොකී කණ්ඩායමේ නායකත්වයට එහා යමින් මහනුවර දිස්ත්‍රික් ඒකාබද්ධ පාසල් හොකී කණ්ඩායමේ නායකත්වය දැරීම දක්වා මා හට හොකී ක්‍රීඩාවේ දක්ෂතා පෙන්වීමට හැකි වුණා. එහිදි මාගේ නායකත්වය යටතේ සමස්ත ලංකා අවුරුදු දහනවයෙන් පහළ ශූරතාව ලබා ගැනීමට හැකි වුණා. එහිදී එම අවසාන තරගයේ අවසාන මිනිත්තුවේ ගෝලයක් වාර්තා කිරීමට මට හැකි වීම තුළින් එදා එම ශූරතාවයට හිමිකම් කීමට මට හැකි වීම මාගේ ජීවිතේ හැරවුම් ලක්ෂ්‍යයක් වුණා. එනම් අ.පො.ස උසස් පෙළ විභාගයේදී මා ලබාගත් ප්‍රතිඵලය මත විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමට සුදුසුකම් ප්‍රමාණවත් නොවී ය. නමුත් විශේෂ කුසලතා මත මම විශ්ව විද්‍යාලයට අයදුම් පතක් ඉදිරිපත් කළා. ඒ අනුව මා අදාළ සම්මුඛ පරීක්ෂණයට මුහුණ දුන්නා.

මා නේවාසිකාගාරයේ රැඳී සිටි කාලයේ එනම් උසස් පෙළ පන්තියේ සිටි කාලයේ ඉංග්‍රීසි ගුරු විභාගයට පෙනී සිටියා. ඉන් මා සමත් වුණා. ගුරු පත්වීම් ලබා දීමට පෙර අපගේ ඉංග්‍රීසි භාෂාව ප්‍රගුණ කිරීමට නුවර

සීතාදේවි බාලිකා ඩෙලික් මධ්‍යස්ථානයට යෑමට සිදුවුණා. උදේ වරුවේ පාසලටත් හවස ඩෙලික් මධ්‍යස්ථානයට යෑමටත් මට සිදුවුණා.

ඒ අතර තුර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල මත පස්දුන් රට(ඉංග්‍රීසි) විද්‍යා පිඨය සඳහා බඳවා ගැනීම සඳහාද විභාගයක් පැවැත්වූවා. මගේ විභාග මධ්‍යස්ථානය නුගේගොඩ අනුලා විද්‍යාලය. මම අම්මාත් සමඟ ගොස් විභාගයට වාඩිවුණා. මම ඒ විභාගයෙන් ද සමත් වුණා. ඉංග්‍රීසි ගුරුවරියක් වීමට ඩෙලික් ගියත් ඊට වඩා වෘත්තීය සුදුසුකම් සපුරා ගත හැකි බැවින් ඩෙලික් අතහැර)මම පස්දුන් රට විද්‍යා පීඨයට ඇතුලත් වුණා. විද්‍යා පීඨයට ඇතුළත්ව සතියකට පසු තමයි මම කැලණිය විශ්ව විද්‍යාලයට තේරී පත්වී ඇති බව දන්වා ලිපියක් ලැබුණේ. ඉතින් මම පස්දුන් රට විද්‍යා පීඨයට සමු දී නැවත ඩෙලික් සමග සම්බන්ධ වුණා. ඩෙලික් පුහුණුව අවසානයේ මා හට ඉංග්‍රීසි උපගුරු පත්වීමක් ලැබුණා. ඒ 1991.03.01 දින. මම මහනුවර දිස්ත්‍රික්කයේ ඇති දුෂ්කර පාසලක් වන බැද්දේගම කනිෂ්ඨ විද්‍යාලයේ සේවයට වාර්තා කළේ ඉංග්‍රීසි ගුරුවරියක් ලෙස. නමුත් පාසලේ ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු නොතිබූ බැවින් විද්‍යාව විෂය ඉගැන්වීම මම ඉතා කැමැත්තෙන් භාර ගත්තා. පාසල අසල නිවසක නැවතී මම එම පාසලේ සේවය කරමින් සිටින අතර විශ්ව විද්‍යාල පාඨමාලාව ආරම්භ කරන බව දන්වා ලිපියක් ලැබුණා. ලැබුණු මම ප්‍රියකළ රැකියාව අතහැර විශ්වවිද්‍යාලයට යෑමට මම අකමැති වුණා. ඉන්පසු මම මාගේ නිවසට තරමක් කිට්ටුව ඇති පාසලකට ස්ථාන මාරු ලබාගත්තා.මෙම අවස්ථාව මට ලැබුණේ බස් රථයේදී හමුවුණු විදුහල්පති කෙනෙකු සමග කතාබහ කරන විටයි. මට විදුහල්පතිවරයාගේ පාසලේ සේවය කිරීමට අවස්ථාව ලබා දෙන්නට එතුමා එකඟ වුණා. කලාප අධ්‍යපන කාර්යාලයේ සේවය කල කලාප අධ්‍යෂකතුමා හමුවී මගේ තත්ත්වය පිළිබඳව පැහැදිලි කර මට විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන අතරතුර ගුරුවරයකු ලෙස සේවය කිරීමට අවස්ථාව ලබාදෙන ලෙස ඉල්ලා සිටියා. එතුමාගේ අවසරය මට ලැබුණා. එතැන් සිට අවුරුදු

හතරක කාලයක් මාගේ ජීවිතයේ ඉතාම කාර්යබහුල ජීවිතයකට මට හුරුවන්නට සිදු වූවා. මා සේවය කලේ  නුවර බලගොල්ල ප්‍රදේශයේ පාසලක. ඉගෙන ගත්තේ කැළණිය විශ්ව විද්‍යාලයේ. ඉතින් සතියකට දින කීපයක් පාසලේ ඉගැන්වීම් කටයුතුවල ද ඉතිරි දින කිහිප විශ්ව විද්‍යාලයේ ඉගෙනුම් කටයුතු වලද නිරත වන්නට වූවා. ඒ හේතුවෙන් නුවර කොළඹ අතර සතියකට දෙතුන් වතාවක් බස් රථයෙන් එහෙට මෙහෙට යන්නට සිදු වූවා. එය හරිම කටුක අමිහිරි අත්දැකීම් ගොඩක්. අභියෝග ගොන්නක්. විද්‍යා විෂය ධාරාව හැදෑරීමේදී ප්‍රායෝගික පරීක්ෂණ සඳහා සහභාගි වීම අනිවාර්යයි.  ඉතින් දැඩි කැපවීම, උත්සාහය, ධෛර්යය හා ක්‍රීඩාවේදී මා ලබාගෙන තිබූ ධාරිතාවය හේතුවෙන් අපහසුතා සියල්ල ජය ගැනීමට මට හැකි වුණා.

කැලණියෙන් පස්වරු හතරයි තිහට පමණ බස් රථයෙන් නැග්ගහම සෑම විටම පාහේ හිටගෙන තමයි නුවරට එන්නට සිදුවුණේ. ඒ එනකොට රෑ නවයයි තිහ විතර වෙනවා. රෑ දහය බස් එක බලාගෙන එන්නේ. ඒ බස් එක නොතිබුණොත් මහනුවර දුම්රිය ස්ථානයේ හෝ ඒ රාත්‍රිය ගත කරලා පසුදා දරුවන්ට උගන්වන්නට පාසලට යන අරමුණින් තමයි තිබුණේ.  ඒ කාලෙ ජංගම දුරකථන පහසුකම් තිබුණොත් නැහැ. කොහොම හරි විශ්ව විද්‍යාලයට යන කාලයේදී අධික වියදම් හේතුවෙන් මා නැවතී සිටි බෝඩිමේ මම උයාගෙනම තමයි කෑවේ. විශ්වවිද්‍යාලයේදීත් මා මලල ක්‍රීඩා මෙන්ම හොකී ක්‍රීඩාවේ නිරත වුනා. වසර දෙකකදී ම හොකී ක්‍රීඩාව සඳහා මට වර්ණ හිමි වුණා.

ඊට අමතරව මෙම කාලයේදී මම ඇඳුම් මැසීමේ පාඨමාලාවත් කේක් අයිසින් පාඨමාලාවත්, කෑම පිසීමේ පාඨමාලාවත්, රූපලාවණ්‍ය පාඨමාලාවත්,  මනාලියන් ඇන්දවීමේ පාඨමාලාවත් වගේම ඇක්වයිනාස් ආයතනයේ ඉංග්‍රීසි පාඨමාලාවක් ද හැදෑරුවා. මම ආසයි ජීවිතේ මට කාන්තාවක් වශයෙන් ජීවිතය සාර්ථක කරගන්නට හැකි සෑම දෙයක්ම සිදු කරන්න. විශ්වවිද්‍යාල අධ්‍යාපනය නිමා වුණේ විද්‍යාවේදී දෙවන පෙළ

ගෞරව උපාධියක් ලබා ගනිමින්. අධිෂ්ඨානය, ධෛර්යය, කැපවීමේ ඉහළම ප්‍රතිඵලයක් ලබාගන්නට හැකිවීම ගැන මම දැනටත් අභිංසක ආඩම්බරයකින් පසුවෙනවා. විශ්ව විද්‍යාල ජීවිතය ගැන කතා කරන්නේ හරිම සතුටකින්. නවක වදයට මම හරි ආසයි. මාගේ යෙහෙළිය හා මම දිවා ආහාරය ඉක්මනින් නිමකර රැග් වෙන්න යනවා. වැඩිහිටි උත්තමයන් කියන කියන දේ ඇඟට නොදැනීම කියනවා කරනවා. අර මගේ හිනාව... ගිය ගමන් එයාලා මට බනිනවා "යකෝ බලපංකෝ මේකි නෙවෙයිනේ රැග් වෙන්නේ අපිනේ" කියලා. හරි සුන්දර කාලයක්. මම විභාගේ ගොඩ ගියේම 'කුප්පි 'දාපු ඒවට ගිහින්, අහන් ඉඳලමයි. ඒ කාලේ බෝඩිං ජීවිතේත් රසබර තැන් බොහෝම යි. ජීවිතේ සෑම අවස්ථාවක්ම සතුටු සිතින් විඳින්නට මට හැකි වුණා, මම කැමති වුණා.

මගේ ආදර සම්බන්ධතාව පටන් ගත්තේ මට රැකියාව ලැබී මාස ගණනාවකට පසුවයි . ඒ මගේ අයියාගේ යාළුවා සමග. කුඩා කල සිටම ඔහු නිතරම අපේ ගෙදර ආව ගිය අයෙක්. ඔහු මා පිළිබඳව අදහසකින් සිටිය බව මා දැන සිටියා. අවුරුදු නවයක පමණ කාලයක් ඔහු මා පිළිබඳව දැඩි උනන්දුවකින් සිටියත් මම ඒ අවස්ථාව මග හැර ගියා. පාසල් කාලය ලස්සනට නිදහසේ ගෙවන්නට තමයි මම ආසා කළේ. මම පාසලට, පාසල් නිල ඇඳුමට ආදරෙයි. ඉතින් නිදහසේ ඉගෙන ගන්න, අනිකුත් බාහිර ක්‍රියාකාරකම් වල යෙදෙන්න මම වෙනත් බාධක මගේ ළඟට ගත්තේ නැහැ කියලයි මට හිතෙන්නේ. ඒත් යෞවනය කියන්නේ එක වෙලාවකට හිත, හැඟීම් සමග තරමක ලොකු පොරයක් අල්ලන කාලයක්. තවත් පුංචි කතාවක් නැතුවාම නොවෙයි කියන්න. අපි හොකී ක්‍රීඩාව පුහුණුවීම් සඳහා ගියේ බෝගම්බර ක්‍රීඩාංගණයට. එතනට ධර්මරාජ කණ්ඩායමත් පුහුණුවට එනවා. වෙලාවකට දෙගොල්ලන්ම පුහුණුවීම් එකට කරනවා. එක් අයෙක් මා පිළිබඳව විශේෂත්වයක් දක්වන බව පෙනුනා. පාසලට අගෞරවයක් වේ යැයි හිතුන නිසාත් ඒ පිළිබඳව පොඩි පාලනයක් සිදු කරන්න වුනා මටත්. මේ කාලයේ ඔහු ඉංග්‍රීසි

පුවත්පතක පෑනේ මිතුරු කවයකට ඔහුගේ නම, ලිපිනය, විස්තර දමා තිබුණා. මට එය අහම්බෙන් පත්තරේ බලන විට දැනගන්නට ලැබුණා. මම පෑනේ මිතුරියක් ලෙස මාගේ නම වෙනස් කර මාගේ යෙහෙළියකගේ ලිපිනය භාවිතා කරමින් ඔහුට ලිපි යැව්වා. මම නේවාසිකාගාරයේ සිටි බැවින් එලෙස කරන්න සිදු වූවා. මට ඔහු ගැන, ඔහුගේ සැබෑ තත්ත්වය ගැන සොයා බලන්නට ලොකු ආශාවක් තිබුණා. දිගින් දිගටම අවුරුද්දක් වගේ කාලයක් ලිපි හුවමාරු උනා. මට මගේ ඉංග්‍රීසි ලිවීමේ හැකියාව වර්ධනය කරගන්නට එය ද ලොකු අවස්ථාවක් කරගත්තා. මේ සියල්ල සිදුවන අතරතුර ඔහු හා මා අතර crush එකක් ඇතිවුණාදෝ කියලත් හිතෙනවා. නමුත් අවසානයේ ඔහු මම හිතන පතන අයෙක් නොවන බව දැනුනු නිසාදෝ එම පෑනේ මිතුරු ලිපි ගනුදෙනු නතර කළා. නමුත් අප අතර බැඳුණු මිතුදම පමණක් අදටත් මිතුදමක් ලෙසම පැවැත්වෙනවා.

මම විශ්ව විද්‍යාලයෙන් පිට වී සුපුරුදු පරිදි ගුරුවරියක ලෙසම කටයුතු කරන්නට අදිටන් කරගත්තා. එකක් මම ගුරු වෘත්තියට ඉතාමත් ප්‍රිය වීම. අනෙක එය අතහැරීමට මැලිවීම. ඉතින් විශ්ව විද්‍යාලයෙන් ඉවත් වූ වසරේම මම ඉංග්‍රීසි ගුරු විද්‍යාලයට ඇතුල් වුණා මාගේ වෘත්තීය පුහුණුව සම්පූර්ණ කර ගැනීමට. ඒ පැණිදෙණිය විශේෂ ඉංග්‍රීසි ගුරු පුහුණු විද්‍යාලයට. ඒ කාලයත් ජීවිතේ හරිම රසවත්, ජීවිතයට අමතක නොවන මිහිරි සිදුවීම් එකතු කළ කාලයක්. ගුරු විද්‍යාලයේ දෙවන වසර ආරම්භ වනවාත් සමගම, එනම් 1996 දී මා විවාහ වනවා මගේ අයියාගේ යහළුවා වූ චන්දන සමග.

ඒ වන විට මා ගුරුවිද්‍යාලයේ 2 වසර. කෙසේ වෙතත් ගුරුවිද්‍යාල අවසාන විභාගය වන විට මා මගේ පළමු වන දරු ප්‍රසූතියට සූදානම් අවසාන විභාගයට මා පෙනී සිටියේ ඉතාමත් අපහසුතාවයන් මැදින් කෙසේ වෙතත් මට හැකි උපරියෙන් එම විභාගය ද හොඳින් සමත් වන්නට මට හැකි වුණා. මගේ දෙවන දරු උපත ඊට වසර තුනකට පසුවත් තෙවන දරු උපත ඊට වසර 3 කට පසුවත් සිදුවුවා. මම දරුවන්

තිදෙනෙකුගේ මවක් වීම මා ජීවිතයේ ලද තවත් සුවිශේෂී ජයග්‍රහණයක් වුණා. බිරිඳක් ලෙස සැමියාටද, මවක් ලෙස දරු තිදෙනාටද ලේලියක් ලෙස මාගේ නැන්දනියට හා මාමණ්ඩියට මාගේ යුතුකම් නොපිරිහලා ඉටු කරමින් සාර්ථක පවුල් ජීවිතයක් ගෙන යෑමට මට හැකිවුණු බව මම තරයේ විශ්වාස කරමි. ඒ සඳහා මා ජීවිතයේ මෙතෙක් ලද සියලුම අත්දැකීම් සම්භාරයන් හා අන්තර්පුද්ගල සම්බන්ධතා පවත්වාගැනීම සම්බන්ධව මා සතු නිපුණතාවයන් යෝධ පිටුවහලක් වූ බව දනිමි. මාගේ ස්වාමිපුරුෂයා සති අන්තයේ පමණක් නිවසට පැමිණෙන රාජකාරී ස්ථානයක රාජකාරී කරන බැවින් දරුවන් තිදෙනා රැක බලා ගනිමින් ඔවුනට හොඳ අධ්‍යාපනයක් හා සම්බර පෞරුෂයකින් යුතු චරිත ලෙස ගොඩනැගීමට මා සිදු කළ කැපකිරීම්, මා ගත් වෙහෙස අපමණයි. මාගේ ස්වාමි පුරුෂයා මට යෝධ සෙවනැල්ලක්. මාගේ වැඩිමහල් දියණිය මහාමායාවේ ප්‍රධාන ශිෂ්‍ය නායිකා තනතුරද, බාල දියණිය උප ප්‍රධාන ශිෂ්‍ය නායිකා තනතුරද දැරූ අතර මහාමායාවේ ආදි ශිෂ්‍යාවක් ලෙස මම ඒ පිළිබඳව උපරිමව සතුටු වුණු අයෙක්.ඔවුන් දෙදෙනාම උසස් අධ්‍යාපන කටයුතු වල යෙදී ඉන්නවා. දෙවන පුතා උපාධිය නිම කර රැකියාවක නිරතව සිටිනවා.

2003 වර්ෂයේ මට දුෂ්කර පාසලක සේවය කරමින් සිටින අවස්ථාවක ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සඳහා බඳවා ගැනීමේ තරග විභාගයට ඉල්ලුම් කළා. දරුවන් තිදෙනෙකු සමඟ ඔවුන්ගේ කටයුතු කරමින් කෙසේ හෝ එම විභාගයට සූදානම් වුනා. පාසලේ මාගේ ඉගැන්වීම් කටයුතු උපරිමව සිදුකරමින් එම දරුවන්ගේ අනාගත ලෝකයට යාමට මංපෙත් තැනුවා. 2003 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විභාගයට ඉදිරිපත් වුණා. 2007 වර්ෂයේ එහි ප්‍රතිඵල ආවා. මා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණිය විභාගයෙන් සමත්ව ඇති බව දන්වා ලිපියක් ලැබුණා. හිතට ලොකු සතුටක් දැනුනා.දුකකුත් දැනුනා ඒ අවස්ථාවේ ඉගැන්වීමෙන් ඈත්වීමට සිදුවීම සම්බන්ධව. ඒ වන

විට මම උසස් පෙළ ජීව විද්‍යා විෂය උගන්වමින් සිටියේ. කෙසේ වෙතත් එම ජයග්‍රහණයත් සමග මම ඉගැන්වීම් සිදුකළ අධ්‍යාපන කලාපයේම විද්‍යා අධ්‍යක්ෂක තනතුරට පත්වීම් ලබුවා. එය මට ලොකු අභියෝගයක් වුණා මම ගුරුවරයෙක්ව සිටි කලාපයේම මා සමග සිටි විද්‍යා විෂය ගුරු භවතුන්ගේම ප්‍රධානියා වීම. නමුත් මම ගුරුවරියක් ලෙසට මාගේ කාර්යභාරය ඉතාමත් ඉහළින් ඉටු කළ කෙනෙකු ලෙස මම කිසිදු පැකිලීමකින් තොරව එම රාජකාරිය භාරගෙන කටයුතු කළා. එම විෂය පිළිබඳ ප්‍රවීණත්වය නිසාම  එම රාජකාරී කටයුතු හොඳින් ඉටු කිරීමට හැකි වුණා. ඊට අමතරව උසස්පෙළ තාක්ෂණවේදය, ද්වී භාෂා විෂය සම්බන්ධීකරණ කටයුතු සම්බන්ධයෙන් කමයි්‍ කිරීමටද මා හට පවරනු ලැබුවා. කලාපයේ සියලුම ගුරුභවතුන්ගේ උපරිම සහයෝගයෙන් එම විෂයයන් සංවර්ධනය සඳහා විවිධ වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කළා.  විෂය ප්‍රතිඵල ඉහළ නැංවීම මෙන්ම විෂයයන් සිසුන් හා ගුරුභවතුන් අතර ජනප්‍රිය කිරිමට මට හැකිවුණා. එය මට තවත් දැනන්නේ මම කලාපයෙන් ඉවත්වීමෙන් පසු මට ගුරුභවතුන්ගෙන් ලැබෙන දුරකථන ඇමතුම් පැසසුම් වලිනි. ඊට අමතරව වසර දොළහක් එම සේවා ස්ථානයේ සිට කලාපයේ පාසල් අධීක්ෂණය සිදුකළා. එහිදී අධ්‍යාපන පද්ධතිය පිළිබඳව මනා අවබෝධයක් හා පෘථුල දැනුමක් ලබා ගැනීමට හැකි වුණා.

2010 වර්ෂයේ දී පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාපති (විද්‍යා අධ්‍යාපන සම්බන්ධ උපාධියක් ලබා ගනිමින් මාගේ තවත් එක්තරා සිහිනයක් සැබෑ කර ගත්තා. එම කාලය ඉතා කාර්යබහුල කාලයක්. රාජකාරී නිවාඩු නොලැබම එම උසස් අධ්‍යාපන කටයුතු, නිවසේ කටයුතු, දරුවන්ගෙ කටයුතු සියල්ල සමබරව කරගෙන යෑමට මට හැකි වුණා. මම මගේ ධාරිතාව පිළිබඳ ලොකු විශ්වාසයකින් කටයුතු කළ අයෙක්.

2018 වර්ෂයේ පාසල් වර්ෂ අවසාන දිනයේදී මම මාතලේ විද්‍යා විදුහලේ විදුහල්පතිනිය ලෙස පත්කිරීමට අදාළ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වුණේ එකම ස්ථානයක එකම කාර්යයක් වසර දොළහක් කරමින් මානසිකව හෙම්බත් වීම නිසාය.

මාතලේ රජයේ විද්‍යා විද්‍යාලයේ දිවයිනේ කීර්තිමත් පාසලක් වන අතර එහි ප්‍රථම විදුහල්පතිනිය ලෙස මා හට රාජකාරී භාරගැනීමට ලැබීම සුවිශේෂී අවස්ථාවක් විය. මා කලාප අධ්‍යාපන කාර්යාලයේදී පාසල් අධීක්ෂණයෙන් ලබා ගත් අත්දැකීම් හා මගේ නායකත්ව කුසලතා, අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගනිමින් එම විදුහලේ භෞතික සම්පත් සංවර්ධනය සඳහා ව්‍යාපෘති 43 ක් ක්‍රියාත්මක කර එහි උපරිමය දක්වා ගෙන ඒමට කටයුතු කළා. 2019 රටෙහි පාසල් ක්‍රියාත්මක කළ දින ගණන අවම මට්ටමක තිබුණේ රටේ ඒ කාලයේ තිබුණු සහාරාන්ගේ ප්‍රහාරය සම්බන්ධව තිබුණු නොසන්සුන්කාරී තත්ත්වය නිසයි. කෙසේ වෙතත් ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන සංවර්ධනය සඳහා මම උපරිම කටයුතු කළා. 2020 වර්ෂයේ කොරෝනා වසන්ගතය හමුවේ ද පාසල වසා දැමීම හේතුවෙන් අධ්‍යාපන කටයුතු සඳහා කිසිදු බලපෑමක් නොවන්නට මාර්ගගත ඉගැන්වීම් සිදු කරන ලදී. ඒ සඳහා ආචාර්ය මණ්ඩලය මෙන්ම ආදි ශිෂ්‍ය සංගමයේද නොමසුරු දායකත්වය ලබා දීම පාසලේ කටයුතු සාර්ථකව සිදුකරගෙන යාමට මට විශාල ශක්තියක් වුණා. 2020 වර්ෂයේ මධ්‍යම පළාතේ අ.පො.ස(සා.පෙ) ප්‍රතිඵල වැඩිවීම වැඩිම පාසල බවට වීද්‍යා වීද්‍යාලය පත් කිරීමට මට හැකි වීම සම්බන්ධව මට අප්‍රමාණ සතුටක් ඇතිවුණා.

ඒ අතර ජාතික පාසල් විදුහල්පති පුරප්පාඩු සඳහා ගැසට් නිවේදනයක් නිකුත් වුණා. මහාමායා බාලිකාවේ විදුහල්පති තනතුර සඳහා ඉල්ලුම් පත් ඉදිරිපත් කළා. සම්මුඛ පරීක්ෂණයට කැදෙව්වා. මම මනා සූදානමකින් ඒ සඳහා සූදානම් වුණා. මගේ හීනයක් තිබ්බේ නැහැ

මහාමායා විදුහල්පති වන්නට. නමුත් මේ වන විට මම 1981 සිට 2021 දක්වා අවුරුදු 40ක් අඛණ්ඩව පාසල සමඟ ඉතාමත්ව සමීපව කටයුතු කළ අයෙක්. ශිෂ්‍යාවක්, ආදි ශිෂ්‍යාවක් හා දෙමාපියෙක් ලෙසත් මේ සම්බන්ධතාවය පවත්වාගෙන යෑමට තවත් ඉදිරියට රාජකාරී මට්ටමින්ද මා හට අවස්ථාව ලැබෙන්නේ නම් පාසලේ සංස්කෘතිය ඉදිරියට ගෙන යෑමට මම ශක්තිමත් බව මට දැනුණා. එම ශක්තියත් සමඟ මාගේ උපරිම සුදුසුකම් සමඟ මම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වුණා. ඉතා සැහැල්ලුවෙන් එයට මුහුණ දුන්නා. දැඩිව කොරෝනා වසංගතය පැතිර ගිය මොහොතක අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මට දුරකථන ඇමතුමක් ලැබුණා මා මහාමායා බාලිකාවෙහි විදුහල්පති ලෙෂ පත්වී ඇති බවත් පත් වීමේ ලිපිය ප්‍රදානය පසුදාම සිදුවන බැවින් ඒ සඳහා පැමිණෙන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පණිවිඩයක් ලැබුණා. ඒ අවධියේ නිවසින් බැහැරට යන විට විශේෂ අවසර පත්‍රයක් ලබාගත යුතුව තිබුණා. ඒ සියල්ල සරිකර ගනිමින් අවදානමක් ගනිමින් අධ්‍යාපන අමාත්‍යංශයට ගියේ හිතේ ලොකු ආඩම්බරයකින් වගේම පොඩි චකිතයකින්. නමුත් මට ලොකු විශ්වාසයක් මා ගැන තියනවා. දිවයිනේ කීර්තිමත්ම පාසලක් වගේම මා ඉගෙනගත් පාසල, මම මම ලෙස බිහි කරපු පාසල, සහ විදුහල්පතිනිය ලෙස පත්වීමට ලැබීම ජීවිතයේ මා ලත් ලොකුම වාසනාවක් වගේම ලොකු අභියෝගයක් ලෙසයි මට දැනුනේ. මම ශක්තිමත් චරිතයක් බව මා හඳුනාගෙන තිබුණා. කිසිවෙකුට මාව වට්ටන්නට නොහැකි බව මම පසක් කරගෙන තිබුණා. මම එහෙම කීවේ මා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දීලා මහාමායාවට තේරී පත්ව ඇති ආරංචිය මහාමායාවට කලින් ලැබිලා තිබුණා. මුද්‍රිත සමාජ මාධ්‍ය හරහා මම මහමායාවට පැමිණීම සම්බන්ධව විවිධ මඩ ප්‍රහාර එල්ල කර තිබුණා. මම මහාමායාවේ රාජකාරි භාර ගැනීම වළක්වාලීමට විවිධ ව්‍යාපාර ක්‍රියාත්මක වී තිබුණා. ඒ කිසිවකට මම සැලුනේ නැහැ. සුදුසුකම් මත පමණක්ම මම මහමායාවට තේරී පත්වීම මට ලොකු ශක්තියක් වුණා. එම සමස්ත සම්මුඛ පරීක්ෂණයෙන්ම ලංකාවෙන්ම ඉහළම ලකුණු

ලබාගත් විදුහල්පතිනියවීම පිළිබඳව මට ඉතාමත් ම නිහතමානි ආඩම්බරයක් මෙන්ම හිතට යෝධ ශක්තියක් දැනුනා. පත්වීමේ ලිපිය ලැබ පසු දින එනම් 2021.06.09 දින මහාමායා බාලිකා විදුහලේ විශාල අභියෝගාත්මක තනතුර වන ''විදුහල්පති'' තනතුරෙහි රාජකාරි භාර ගත්තා.

මගේ ජීවිතේ මා ලද ලොකුම භාග්‍ය මට හිමි වුණා. රාජ්‍ය නිලධාරිනියක් ලෙස මගේ වගකීම හා වගවීම මනාව ඉටු කිරීමට මාගේ උපරිමයෙන් කටයුතු කිරීමට මා ශක්තිමත් කළ මහාමායා මවුනි, ඔබට මාගේ හෘදයාංගම උපහාරය පුද කරනවා. ඔබ සෙවණේ හිඳිමින් ඔබව තව තවත් ශක්තිමත් කරමින් ඔබව දිනෙන් දින ඉහළටම ඔසවා තැබීමට, ඔබගේ කිතුගොස ලොවට පතුරවාලීමට මා උපරිමයෙන් කැපවන බව මම ඔබට දිවි හිමියෙන් පොරොන්දු වෙනවා.

**චිරං ජයතු මහාමායා මව්නි !**

# ආ මගට පසුවදන

විහවතා රාශියක් අතැතිව මෙලොව දුටු දියණියක අභියෝග ආශීර්වාද කොටගෙන තම නෙත් පෑදූ විදූමෑණියන්ට නායකත්වය දීමට පැමිණි ගමන්මගෙහි රස මුසු තැන් අළලා පද බඳින ලද මෙම විද්‍යුත් කෘතිය සවයංප්‍රත්‍යවේක්ෂණයකි. දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියේ නියමුවානන් ලෙස ග්‍රන්ථකරණයට අත්පොත් තබන පුංචි ලේඛක මල් කැකුළු පුබුදු කරවන හිරුකිරණකට සම වෙයි. මෙම පොත් පිංච ජාත්‍යන්තර පාඨක සිත් දිනාගනු ඇත.

සෙනෙවිරත්න මහලේකම්

2023 .12. 24

ISBN 978-624-208-152-6 22